වාරියපොල  ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 15 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වාරියපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස රථ වාහනවලින් ගාස්තු අය කිරීම වෙනුවෙන් රු.13,542 ක් වූ දීමනා ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස බස් රථවලින් ගාස්තු අය කිරීම වෙනුවෙන් රු.55,800 ක් වූ දීමනා ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ රු.1,520 ක් වූ දුම්රිය බිල්පත් පියවීම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගෙන තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 77,361,081 ක් වූ අතර එයින් වර්ෂ 03 කට වැඩි කාලයක් අයනොවී පවතින ශේෂවල අගය රු.6,404,520 ක් වී තිබුණි.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 61,968,735 ක් වූ අතර එයින් රු.4,161,572 ක් වසර 03 කට වැඩි කාලයක සිට ගෙවිය යුතු ශේෂයන් විය.

### 1.3.4 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

තැන්පත් කළ දින සිට වසර 02 ක් ඉක්මවූ රු.461,101 ක තැන්පතු නිරවුල් කිරීමට මුදල් රෙගුලාසි 570 සහ 571 නියමයන් පරිදි පියවර ගෙන නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,289,766 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,185,282 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,104,484 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.130,823,997 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.184,555,739 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.2,558,024 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 24,901 | 24,687 | 214 | පෞද්ගලික පඩිනඩි | 82,596 | 52,380 | (30,216) |
| (ii) | වෙනත් | | | | අනෙකුත් | 35,006 | 86,896 | 51,890 |
| | උප එකතුව | 148,991 | 148,774 | 217 | උප එකතුව | 117,602 | 139,276 | 21,674 |
| | | 173,892 | 173,461 | 431 | | | | |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 130,824 | 148,423 | (17,599) | ප්‍රාග්ධන | 184,556 | 156,852 | (27,704) |
| | මුළු එකතුව | 304,716 | 321,884 | (17,168) | වියදම මුළු එකතුව | 302,158 | 296,128 | (6,030) |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 56,290 | 34,185 | 22,105 | අතිරික්තය | 25,558 | 25,756 | (198) |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.173,892,105 න් සියයට 70 ක් හෙවත් රු.122,354,154 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.130,823,997 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මඟින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.117,602,339 න් සියයට 70 ක් හෙවත් රු.82,595,599 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 94 ක් හෙවත් රු.78,429,691 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබූ බැවින් එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.184,555,739 න් සියයට 29 ක් හෙවත් රු.55,342,162 ක් පමණක් සභා අරමුදලින් වැය වූ අතර ඉතිරි සියයට 70 ක් හෙවත් රු.129,213,577 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් සිදු කල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂ හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තු ගත | 2015 තථ්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තු ගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 3,123 | 2,212 | 1,285 | 4,270 | 4,879 | 1,282 |
| (ii) බදුකුලී | 9,112 | 8,991 | 361 | 9,195 | 8,564 | 352 |
| (iii) බලපත්‍ර ගාස්තු | 644 | 644 | - | 657 | 799 | 29 |
| (iv) වෙනත් ආදායම් | 41,148 | 2,828 | 45,091 | 93,204 | 145,607 | 59,554 |
| එකතුව | 54,027 | 14,675 | *46,737 | 107,326 | 159,849 | 61,217 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

පහත විස්තර දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | 2015/01/01 දක්වා හිඟයෙන් | ආදායම් රැස් කිරීම බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | හිඟහිටි ශේෂය බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 1,282,428 | 3,123,204 | 4,405,632 | 901,930 | 2,211,960 | 3,113,890 | 380,498 | 911,244 | 1,291,742 |
| කුලී ආදායම් | 351,865 | 9,111,763 | 9,463,628 | 111,600 | 8,991,263 | 9,102,863 | 240,265 | 120,500 | 360,765 |
| බලපත්‍ර ගාස්ත | - | 643,890 | 643,890 | - | 643,890 | 643,890 | - | - | - |
| සේවා සඳහා ගාස්තු | 29,400 | - | 29,400 | 29,400 | - | 29,400 | - | - | - |
| වරෙන්තු ගාස්තු හා දඩ | 502,625 | 4,126,675 | 4,629,300 | 502,625 | 2,827,550 | 3,330,175 | - | 1,299,125 | 1,299,125 |
| වෙනත් ආදායම් | 59,051,972 | 37,021,403 | 96,073,375 | 56,352,669 | - | 56,352,669 | 2,699,303 | 37,021,403 | 39,720,706 |
| එකතුව | 61,218,290 | 54,026,935 | 115,245,225 | 57,898,224 | 14,674,663 | 72,572,887 | 3,320,066 | 39,352,272 | *42,672,338 |

* මූල්‍ය ප්‍රකාශනවල සඳහන් හිඟ ශේෂයන් සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව වූ ශේෂ සමඟ නොසැසඳේ.

### 2.3.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු ඒකක 4134 ක් සඳහා රු.3,070,593 ක් බිල්කර පැවති අතර 2015 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟය රු.1,182,080 ක් විය. ආරම්භක වරිපනම් බදු හිඟය රු.1,167,802 ක් වූ අතර ඒ තුළ උප කාර්යාලයේ හිඟය රු.301,625 ක් විය. මින් වර්ෂය තුළ අයකර පැවතියේ රු.185,109 ක් හෙවත් සියයට 61ක් පමණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ ආරම්භක හිඟය රු.107,694 ක් වූ අතර ඉන් වර්ෂය තුල අයකර පැවතියේ රු.12,920 ක් හෙවත් සියයට 12 ක් පමණි. මේ අනුව ක්ෂේත්‍රයේ හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය ඉතාමත් පහළ මට්ටමක පැවතින.

### 2.3.4 බදු කුලී

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වත්කම් බදු දීමේ හිඟ ආදායම් රු.251,345 ක් විය. ඉන් රු.204,350 ක්ම 2009 වර්ෂයේ සිට ඉදිරියට පැවත එන ශේෂයන් විය.

## 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.1,299,125 ක්ද මුද්දර ගාස්තු රු.39,720,706 ක්ද විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.5,883,720 ක් වූ අතර ඒ තුළ විශ්‍රාම යාම, ස්ථාන මාරු වීම හා සේවයට නොපැමිණීම වැනි හේතු මත 2000 වර්ෂයේ සිට මේ දක්වා වසර 16 ක පමණ කාලයක සිට අය නොවන රු.31,992 ක් වටිනා ණය ශේෂ 23 ක් පැවති අතර එම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ ශේෂය රු.12,508 ක් වූ බැංකු ගිණුම් 02 ක් අක්‍රීයව පැවතුණි.

### 3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ රු.520,000 ක්ද සහා අරමුදල් රු.274,347 ක්ද වැය කර කොන්ක්‍රීට් කුළුණු යකඩ කාප්ප හා සින්ක් ඇලුමේනියම් තහඩු යොදා බිමට කොන්ක්‍රීට් දමා අඩක් වැඩ නිමකර තිබුණු වාරියපොල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ රැස්වීම් ශාලාව සකස් කර අදාල අරමුණට පටහැනිව අලවි කල හැකි කසල ද්‍රව්‍ය රැස් කිරීම සඳහා භාවිතා කර තිබුණි.

### 3.3 පාරිසරික ගැටලු

බිම් කොටස් 80 කින් සමන්විත වු තලගහගම ඉඩම කොටස් කර විකිණීමේදී ඉඩමෙහි සංවර්ධන සැලැස්ම 2015 ජනවාරි 18 දින සභාව විසින් අනුමත කර තිබුණු අතර මාර්ගවල පළල මීටර් 6 ක් පමණක් විය. බිම් කොටස් සඳහා තෙකලා විදුලිය ලබා දී නොතිබුණි. ජල පහසුකම් සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණු අතර ඉඩම අවසානයේ වූ රූඩ් 03 පර්චස් 10 ක කට්ටි අංක 73 සභාවේ පොදු පහසුකම් සඳහා වෙන්කර තිබුණි. නමුත් එම බිම් කොටසේ ගලවා ඉවත් කරන පොල් ගස් හා වෙනත් ගස්වල මුල් කොටස් හා කසල ඇතුළුව වෙනත් කසල බැහැර කිරීම සඳහා භාවිතා කර තිබුණි. තවද ඉඩම් කොටස් කිරීමේදී ඉදිකළ මාර්ග දෙපස වූ කාණු පද්ධතියේ ජලය අදාල ඉඩමට ගලා බසින බවද නිරීක්ෂණය විය.

## 04. යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

### 4.1 වත්කම් කළමනාකරණය

#### 4.1.1 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දැයට කිරුළ වැඩ සටහන යටතේ වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ කොන්ත්‍රාත් ක්‍රමයට ඉදිකර තිබුණු බමුණාකොටුව සතිපොලෙහි ඉහල කෙලවරෙහි පැවති මාළු ලැල්ල වෙත වෙළඳුන් වෙළඳාමට යෑම ප්‍රතික්ෂේප කර තිබුණු අතර 2015 ඔක්තෝබර් 09 දින භෞතිකව පරික්ෂා කිරීමේදී අදාල මාළු ලැල්ල පිහිටි ප්‍රදේශය හා එහි අල්ලා ඇති බිම් ගල් අතර වල් වැවී තිබුණි. ඉදිකර තිබුණු වැසිකිලි පද්ධතියද පරිහරණයෙන් තොරව තිබීම හේතුවෙන් වල් බිහිවී වැවී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ වාහන 05 ක් වසර 04 ක පමණ සිට භාවිතයට ගැනීමට නොහැකි ලෙස අබලන්ව පැවතුණු අතර අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන ඉවත් කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

### 4.2 බේරුම් නොකළ බැරකම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දායකය සඳහා රු.3,056,174 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීමට තිබුණි.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය